## දික්වැල්ල ප්‍රාදේශීය සභාව.
## මාතර දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 27 උනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු මස 08 දින සභාවේ සභාපතිවරයා වෙත යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පරිගණක ගත කර පිළියෙල කර තිබුණ අතර එම පරිගණක ගත කරන ලදක්‍රමවේදය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණෙන් සමාලෝචිත වර්ෂයේ ගනුදෙනු නවැරදිව ගිණුම් ගතවී තිබේද යන්න තහවුරු කරගත නොහැකි වූ අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළයුතු ප්‍රා.ස. ආකෘති හා උපලේඛණද පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති පරිදි භාවිතා කළයුතු ප්‍රා.ස.3 සිට ප්‍රා.ස. 19 දක්වා වූ ආකෘති භාවිතා කර ගිණුම් පිළියෙල කර නොතිබුණෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂයන් නිවැරදි බවට තහවුරු නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂය තුල සභාව විසින් මිළදී ගෙන තිබුණු රු.488,148 ක් වටිනා පුස්තකාල පොත්, පරිගණක ප්‍රින්ටරයක්, යූ.පී.එස්. එකක්, හා පෙර පාසැල් උපකරණ ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තු කළ මුද්දර ගාස්තු ආදායම රු.5,500,000 ක් ලෙසට ආදායම් ගිණුම් වල දක්වා තිබූ අතර තථ්‍ය ලැබීම රු.9,799,402 ක විය. සමාලොචිත වර්ෂයේදී රු.4,299,402 ක ඌන වෙන්කිරීම් සඳහා ජර්නල් සටහන් මගින් ගිණුම් ගැලපිය යුතු වුවද එය සිදුකර නොතිබුණි.

(ඈ) රු.7,731,489 ක් වටිනා වත්කම් ගිණුම් විෂයයන් 06 ක් හා රු.8,506,329 ක් වටිනා වගකීම් ගිණුම් විෂයයන් 06 කට අදාල ආරම්භක ශේෂයන් ජර්නල් සටහන් මගින් අදාල ලෙජර් ගිණුම් වලට මාරු කළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ වරිපනම්, අක්කර බදු, හා විනෝද බදු සඳහා වූ පාලන ගිණුම් වල ආරම්භක ශේෂයට, වර්ෂයේ බිල්කිරීම් එකතු කර වර්ෂයේ ලැබීම් හා වර්ෂය අවසාන ශේෂය ගැලපීමෙන් පාලන ගිණුම් සකස් කර නොතිබුණි.

(ඊ) සමලෝචිත වර්ෂය තුල ප්‍රාදේශීය සභාවේ ඉඩම් හා ගොඩනැගිලි උපලේඛණයට අනුව සභාවට පරිත්‍යාග වශයෙන් ලැබුණු අක්කර 04 රූඩ් 01 ප්‍රමාණයේ ඉඩම් කට්ටි 13 ක වටිනාකම තක්සේරු කර ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ හිඟහිටි වෙනත් ආදායම් ගිණුමේ ආරම්භක ශේෂය රු.4,477,704 ක් වුවද ලෙජර් ගිණුමට අනුව වටිනාකම රු.8,506,331 ක් වූයෙන් වෙනස රු.4,028,627 ක් විය.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව සමුච්චිත අරමුදල් ගිණුමේ ඉදිරියට ගෙනා වටිනාකම රු.95,153,969 ක ඍණ ශේෂයක් වුවද ප්‍රධාන ලෙජරය අනුව වටිනාකම රු.40,234,077 ක් වාසිදායක ශේෂයක් විය.

(එ) සමාලෝචිත වර්ෂයේදී ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ලැබී තිබූ රු.395,698 ක් වටිනා බෙහෙත් තොග ලැබීම් ලෙස ගිණුම්ගතව නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසානයට අත ඉතිරි බෙහෙත් තොග අගය රු.54,193 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල රු.140,492 ක් ලෙසට දක්වා තිබුණෙන් වෙනස රු.86,299 ක් විය.

(ඒ) ගිණුම් විෂයයන් 13 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.57,826,546 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.42,664,381 ක් වූයෙන් වෙනස රු.15,162,165 ක් විය.

(ඔ) 2012 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම හා ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම පිළිවෙලින් රු.107,500 හා රු.85,044,498 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.90,297,692 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.80,589,896 ක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,329,023 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් බදු | 1,869 | 1,490 | 775 |
| (ii) | බදු කුලී | 4,627 | 6,522 | 3,454 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 667 | 950 | 746 |
| (iv) | වෙනත් ආදායම් | 6,457 | 6,498 | 30,416 |

2.2.2 හිඟ බදු හා ගාස්තු

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ලැබිය යුතු රු.1,409,662 ක බදු හා ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාසතු.

පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.253,384 ක මුදලක්ද, මුද්දර ගාස්තු වශයෙන් රු.5,743,142 ක මුදලක්ද ලැබිය යුතුව තිබුණි.

2.2.4 කඩ කාමර කුලී

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දික්වැල්ල බස් නැවතුම් පල කඩ කාමර

බිම් මහලේ කඩකාමර 05 ක් මසකට රු. 500 බැගින්ද ඉහල මහලේ කඩ කාමර 13 ක් මසකට රු.800 බැගින්ද 2010 මැයි 01 දින ගිවිසුම් අත්සන් කර බදුදී තිබුණි. ගිවිසුමේ පළමු කොන්දේසිය අනුව නියමිත බදු මුදල් සෑම මසකම 25 දිනට පෙර ගෙවිය යුතු වුවත් එකී කඩකාමර 13 සඳහා එසේ කටයුතු කර නොතිබුණෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි මුදල රු.88,400 ක් විය.

(ආ) දික්වැල්ල පොදු වෙළඳ පොල කඩ කාමර

දික්වැල්ල පොදු වෙළඳ පොලේ කඩ කාමර 20 ක් සඳහා අත්සන් කර තිබූ ගිවිසුම්වල කාලය 2012 දෙසැම්බර් 31 න් අවසන්ව තිබූ අතර ගිවිසුම් කාලය අවසන්ව මාස 04 ක් ඉකුත් වනතුරුත් අළුතින් ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු නොකර සභාව බදුකරුවන් වෙත වෙළදාම් කර ගෙන යාමට ඉඩදී තිබුණි. ගිවිසුමේ කොන්දේසි 01, 02, 03 උල්ලංඝණය වී තිබූ අතර නියමිත පරිදි බදු මුදල් ගෙවීම් පැහැර හැරීමේදී බදු ගිවිසුම අවලංගු වන බව දක්වා තිබුණද තවදුරටත් බදුකරුවන් වෙළදාමේ යෙදී සිටින අතර කඩ කාමර 10 කින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.150,750 ක මුදලක් හිඟහිට තිබුණි.

(ඇ) බෙලිවත්ත පොදු වෙළඳ පොල කඩ කාමර

බෙලිවත්ත පොදු වෙළඳ පොලෙහි කඩ කාමර 13 ක් සඳහා 2010 ජුනි 01 දින සට 2013 ජුනි 01 දින දක්වා තුන් අවුරුදු කාලයකට ගිවිසුම් අත්සන් කර බදුදී දී තිබුණු අතර බදු ගිවිසුමේ 09 වන වගන්තිය අනුව බදුගෙන ඇති ස්ථානය ව්‍යාපාරික කටයුතු සඳහා විවෘතව තැබිය යුතු අතර මොනම හේතුවක් නිසා

හේතු රහිතව වසා තැබීම නොකළ යුතු වේ. එහෙත් අංක 01, 02,04, 05 හා 13 යන කඩ කාමර වසා තිබූ අතර එම කඩ කාමර වලින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.143,500 ක මුදලක් හිඟහිට තිබුණි.

තවද, වෙළඳ පොලෙහි අංක 03,06,07 කඩ කාමර බදු ගිවිසුමට පටහැනිව වෙනත් පුද්ගලයන් ව්‍යාපාරික කටයුතු වල නිරතවන බව 2013 මැයි 03 දිනැති භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර සභාවේ වගකිව යුතු නිලධාරීන් ඒ බවට සභාව දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වලස්ගල පොදු වෙළඳ පොල කඩකාමර

(i) වලස්ගල පොදු වෙළඳ පොලෙහි අංක 01 සහ 02 කඩ කාමර වලින් 2012 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.10,500 ක් හා රු.4,500 ක් අයවීමට තිබුණි.

(ii) අංක 03 කඩ කාමරයේ බදු කාලය 2012 සැප්තැම්බර් 01 දිනෙන් අවසන්ව තිබූ අතර ගිවිසුම් කාලය ඉකුත් වී මාස 07 ක් ගත වී තිබූ නමුත් ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද මෙම කඩ කාමරය ව්‍යාපෘති කටයුතු සඳහා වෙනත් පුද්ගලයෙකුට අතුරු බදුදී තිබූ බවද 2013 මැයි 03 දිනැති භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඉ) රත්මලේ පොදු වෙළඳ පොල කඩ කාමර

රත්මලේ පොදු වෙළඳ පොල කඩ කාමර 02 කින් රු.50,500 ක මුදලක්ද රදම්පල කඩ සාප්පු සංකීර්ණය කඩ කාමර 10 කින් රු.18,800 ක්ද වශයෙන් රු.69,300 ක් අයවිය යුතුව පැවතුනි.

2.3 මානව සම්පත් කළමනාකරණය.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 52 ක්ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 65 ක්ද විය.

සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්ය මණ්ඩල වැටුප් හා මන්ත දීමනා ලෙස රු.17,883,500 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂයේ වැටුප් වියදම රු. 18,681,608 ක් වූයෙන් සභා අරමුදලට රු.798,108 ක අතිරේක වැය බරක් ඇති වී තිබුණි.

(ආ) 2002 ජනවාරි 03 අංක 14 හා 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවාගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනව සේවකයින් 25 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් සභා අරමුදලින් රු.3,868,839 ක මුදලක් ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකළහොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද අවධාරණය කර තිබුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලංකා විදුලි බල මණ්ඩලය සමඟ අත්සන් කල ගිවිසුම අනුව අනුමත වීථි පහන් සංඛ්‍යාව 186 ක් වුවද පහන් 308 ක් සවිකර තිබුණි. විදුල පහන් උපාංග සවිකරන ලද ස්ථාන හෝ එම උපාංග සවිකරන ලද බවට අධීක්ෂණ නිලධාරියෙකු විසින්, සභාව ගන්නා ලද තීරණ පිළිබඳ ලේඛණ ඉදිරිපත් නොකෙරිණි.

(ආ) ආයුර්වේද බෙහෙත් ශාලා දෙකෙහි ස්ථිර කාර්ය මණ්ඩලයට ආයුර්වේද වෛද්‍යවරුන් දෙදෙනෙක් එක් ඖෂධ සංයෝජකයෙක් හා කම්කරුවන් දෙදෙනෙක් ඇතුළත් වූ අතර කාර්ය මණ්ඩලයට සමාලෝචිත වර්ෂය සඳහා රු.1,401,317 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. පළාත් පාලන ආයතන මගින් පාලනය වන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවලට රජයේ ආධාර ලබා ගැනීම සඳහා ආයුර්වේද 39 ආකෘතිය මගින් වෛද්‍යවරුන් දෙදෙනාගේ වැටුප් සහ දීමනා ඖෂධ සංයෝජක හා සුළු සේවකයින්ගේ වැටුප් සහ දීමනා, ගොඩනැගිලි, කුලී බෙහෙත්වල වටිනාකම එක් රෝගියෙකු වෙනුවෙන් අයවිය යුතු ගාස්තු, ලැබිය යුතු ප්‍රමාණයන් ගණනය කර ආයුර්වේද ආධාර ලබා ගැනීම සඳහා ආයුර්වේද කොමසාරිස්වරයා වෙත යැවීම සිදුකර නොතිබුණි.

## 2.5 අනවසර ඉදිකිරීම්

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) හි (ඉ) සහ (උ) සහ 126 (ix) (ඉ) හි සඳහන් අතුරු ව්‍යවස්ථාවලට විෂය වන කරුණු සම්බන්ධයෙන් කටයුතු නොකිරීම නිසා සභා බල ප්‍රදේශය තුළ අනවසර ඉදිකිරීම් 26 ක් ඉදිකර තිබුණි.

(ආ) පනතේ සඳහන් විධිවිධාන අනුව සභාව විසින් අනවසර ඉදිකිරීම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාද පනවා නොතිබුණෙන් එකී කරුණ සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාවේ පාලනයට අයත් මෙම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 55(1) හි විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

## 2.6 අයවීමට ඇති සේවක ණය

2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය සහ අත්තිකාරම් ශේෂවල එකතුව රු.2,551,214 ක් විය.

## 2.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභාව මගින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අපද්‍රව්‍ය එකතු කරන ප්‍රධාන මාර්ග කි.මී. 7.2 ක්ද අතුරු මාර්ග කි.මී. 8.05 ක දිරන හා නොදිරන කසල උපයෝගී කරගෙන ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතිය පවත්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් සභාව විසින් වැටුප් වියදම් වශයෙන් රු.1,266,706 ක්ද වාහන වියදම් වශයෙන් රු.1,955,723 ක මුදලකද වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) බැහැර කරන අපද්‍රව්‍ය යොදාගනිමින් කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබුණි.

(ii) පරිසර ආරක්ෂාව සම්බන්ධයෙන් පළාත් සභාව මගින් අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් යොමුකිරීම් කර නොතිබුණු අතර අවමංගල්‍ය ශාලාවල හා රෝහල් වල අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ වගකීම සභාව මගින් පවරා නොගෙන පෞද්ගලිකවම අයිතිකරුවන්ට පවරා දී තිබුණි.

(iii) සභා බල ප්‍රදේශය තුළ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වෙන්කර තිබූ ස්ථාන දෙක නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණි.

---

3. <u>පද්ධති හා පාලන</u>

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය